# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2358/04 – 2023 නොවැම්බර් මස 13 වැනි සඳුදා – 2023.11.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 524, මාදිවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාදිවෙල (මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක CO/MHR/2021/200 හා 2021.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර 'A' - ගොඩපරගහවත්ත - ප්‍රමාණයඃ හෙක්. 0.0313

උතුරට: මාදිවෙල පාර සහ රජය හිමිකම් කියන ගොඩපරගහකුඹුර නැමැති ඉඩම; නැගෙනහිරට: රජය හිමිකම් කියන ගොඩපරග හකුඹුර නැමැති ඉඩම; දකුණට: රජය හිමිකම් කියන ගොඩපරග හකුඹුර නැමැති ඉඩම සහ මාදිවෙල පාරේ වරි. අංක 314 දරන ඉඩම; බටහිරට: මාදිවෙල පාර.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/8/2020/UDA/271.
2023 අගෝස්තු මස 31 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 11 - 0108



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*